# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන පරීක්ෂණය - 2021
## වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන පරීක්ෂණය - 2021

ඉහත පරීක්ෂණවලට අදාලව **2024 මැයි මස 02 දින සිට 2024 මැයි මස 14 දින** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට බලාපොරොත්තුවන සියලු අපේක්ෂකයින්, කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට (www.cdce.kln.ac.lk) පිවිස නියමිත ආකෘති පත්‍රය මගින් අදාළ පරීක්ෂණය සඳහා අයදුම් කළ යුතු වේ.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද විභාග අයදුම්පත්‍රය සමග මහජන බැංකුව වෙත අදාළ පරිදි ගෙවීම් කිරීමෙන් පසුව ලැබෙන පාරිභෝගික පිටපත (Customer's Copy) අමුණා **2024 මැයි 15 වන දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, තැ.පෙ. 03, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**මෙම පරීක්ෂණ 2015 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වු සිසුන්ට අදාළ සිව්වන පරීක්ෂණය ද 2016 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වු සිසුන්ට අදාළ තෙවන පරීක්ෂණය ද වන අතර මීට පෙර අධ්‍යයන වර්ෂවල ලියාපදිංචි වු සිසුන්ටද මේ සඳහා අයදුම් කළ හැක.**

ඉහත පරීක්ෂණය **2024 ජුනි** මස දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේදී පැවැත්වීමට කටයුතු සුදානම් කොට ඇත.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.
2024.04.29